සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# சப்ரகமுவ மாகாண கல்வித் திணைக்களம்
# Provincial Department of Education - Sabaragamuwa

## අවසාන වාර පරීක්ෂණය - 2025
## மூன்றாம் தவணைப் பரீட்சை - 2025
## THIRD TERM TEST - 2025

| 90 | S | I,II |
|---|---|---|

| 11 ශ්‍රේණිය | නිර්මාණකරණය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය - I, II | පැය තුනයි |
|---|---|---|

**අමතර කියවීම් කාලය - මි. 10යි.** අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

### නිර්මාණකරණය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය - I

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) කේතුවක කැපුම් තලය, කේතුවේ ආනත පාදයකට සමාන්තර වූ විට ලැබෙන තල රූපය වන්නේ,
1. ඉලිප්සයකි.　2. බහුවලයකි.　3. පරාවලයකි.　4. වෘත්තයකි.

(02) රූපයේ Q ලෙස පෙන්වා ඇත්තේ,




1. සුළු කෝණයකි.　2. සරල කෝණයකි.
3. පරාවර්තන කෝණයකි.　4. මහා කෝණයකි.

(03) පහත දැක්වෙන්නේ ජ්‍යාමිතික නිර්මාණ හා සම්බන්ධ රූප සටහනකි. ඒ සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශන අතුරින් නිවැරදි ප්‍රකාශන තෝරන්න.




1. AB සමාන කොටස් 06 ට බෙදීම සඳහා යොදා ගනී.
2. වෘත්තයක් තුළ සවිධි බහු අස්‍රය නිර්මාණයේ දී මූලිකව යොදා ගනී.
3. පාදයක දිග දී තිබෙන විට සවිධි පංචාස්‍රයක් නිර්මාණය කිරීමේ දී යොදා ගනී.
4. සරල පරිමාණයක් ඇඳීමේ දී මූලික පියවර වශයෙන් යොදා ගනී.

(04) කාර්මික චිත්‍ර ඇඳිමේ දී භාවිතයට ගන්නා A4 කඩදාසියක සම්මත දිග x පළල මිනුම් වන්නේ (මිලි මීටර)
1. 841 x 594　2. 297 x 210　3. 594 x 420　4. 210 x 397

(05) තෙවන කෝණ ක්‍රමයට අදාළව සංකේතය නිවැරදිව දක්වා ඇත්තේ,

1. 

2. 

3. 

4. 

(06) කාර්මික චිත්‍ර ඇඳීමේ දී වස්තුවක මායිම් රේඛා ඇඳීමට භාවිතා කරන පැන්සල් වර්ගය වන්නේ,
1. 5 H　2. B　3. 2 H　4. HN

(07) මීටර 3 ත් හා මීටර 4 ත් දිග සරල දාර දෙකක් එකිනෙකට ලම්භක ලෙස හමුවේ නම් එම දාර දෙකේ දෙකෙළවර යා කරන දිග වනුයේ,

1. 5 m කි. 2. 10 m කි. 3. 7 m කි. 4. 12 m කි.

(08) පහත දී ඇති වස්තූන් අතරින් විකසන තල නිර්මාණය කළ නොහැකි වස්තුව වන්නේ,

1. හිස් ඇසුරුම් ටින් එකක් 2. හිස් ඇසුරුම් පෙට්ටියක්
3. තහඩු වලින් නිමවන ලද පුනීලයක් 4. ලෝහ කුට්ටියක්

(09) දෙකෙළවර ඝන දාම රේඛා යොදා ගන්නේ වස්තුවක,

1. ආනත ස්ථාන දැක්වීමට 2. ඡේදනය වන ස්ථාන දැක්වීමට
3. ලම්භ සමච්ඡේදක දැක්වීමට 4. නොපෙනෙන දාර දැක්වීමට

(10) ජ්‍යාමිතික උපකරණ පෙට්ටියේ ඇති විහිත චතුරස්‍ර පමණක් භාවිත කර ලකුණු කර ගත හැකි කෝණවල විශාලත්වය සඳහන් වරණ තෝරන්න.

1. $30^0$, $45^0$, $105^0$, $120^0$ 2. $30^0$, $60^0$, $115^0$, $120^0$
3. $30^0$, $45^0$, $110^0$, $135^0$ 4. $30^0$, $60^0$, $125^0$, $160^0$

(11) වර්ණ හතරකින් අගය දැක්වෙන ප්‍රතිරෝදකයක තුන්වන වර්ණ පෙට්ටිය කැබිලි වන විට එම ප්‍රතිරෝධකයේ අගය පිහිටන පරාසය කුමක් ද?

1. 100Ω - 990Ω 2. 1KΩ - 9.9KΩ
3. 10KΩ - 99KΩ 4. 100KΩ - 990KΩ

(12) සිඟිති පරිපථ බිඳිනයක් ගෘහ විදුලි පරිපථයකට සම්බන්ධ කිරීමේ අරමුණ කුමක් ද?

1. උප පරිපථයක අධිධාරා ගැලීමක දී සිදුවන හානිය වැළැක්වීම.
2. අකුණුවලින් පරිපථය ආරක්ෂා කිරීම.
3. විදුලි සැර වැදීමක දී පුද්ගලයින් ආරක්ෂා කිරීම.
4. පරිපථය තුළින් ගලා යන ධාරාව වැඩි වූ විට භූගත කිරීම

(13) ප්‍රතිසම මල්ටි මීටරයක පරාස කෝණය ප්‍රතිරෝධවල $X_{10}$ වෙතට යොමුකර ඇති විට මුහුණතේ ඇති කටුව 47 ස්ථානයේ රැඳුනි නම් අදාළ ප්‍රතිරෝධකයේ අගය කුමක් ද?

1. 47 KΩ 2. 470 KΩ 3. 4.7 KΩ 4. 470 KΩ

(14) කේත ක්‍රමයට 104 ලෙස සටහන් කර ඇති ධාරිත්‍රකයක අගය මයික්‍රෝෆැරඩ්වලින් කොපමණ ද?

1. 0.01 « F 2. 0.1 « F 3. 104 « F 4. 100 000 « F

(15) 


රූපයේ දක්වා ඇති $C_1$, $C_2$ යන ධාරිතක දෙක වෙනුවට යෙදිය හැකි තනි ධාරිත්‍රකයේ අගය කොපමණ ද?

1. 5 «F 2. 10 «F 3. 20 «F 4. 40 «F

(16) රූපයේ දැක්වෙන පරිපථයේ R ප්‍රතිරෝධකය හරහා සම්බන්ධ කර ඇති වෝල්ට් මීටරයක් 0.4 W එම ප්‍රතිරෝධකය තුළින් ගලා යන ධාරාව කොපමණ ද?




1. 10 A 2. 3 A
3. 0.4 A 4. 0.1A

(17) විදුලි ජවය මැනීමට භාවිත කරන අන්තර් ජාතික ඒකකය කුමක් ද?

1. හෙන්රි 2. කූලෝම් 3. වොට් 4. වොට් පැය

(18) විදුලි පාහනයක ප්‍රධාන කොටස් මොනවාද?
1. ජව සැපයුම් වයරය, පරිවාරක මිට, හීක්‍රෝම් දඟරය, තුඩ
2. ජව සැපයුම් වයරය, හික්‍රෝම් දගරය, පෑස්සුම් ඊයම්, තුඩ
3. තුඩ, හික්‍රෝම් දගරය, පෑස්සුම් ඊයම්, සන්දසය
4. පරිවාරක මිට, ජව සැපුයම් වයරය, හීක්‍රෝම් දගරය, පෑස්සුම් ඊයම්

(19) විදුලි බල මණ්ඩලය මගින් සපයනු ලබන ගෘහස්ථ විදුලි සැපයුමේ 230V ලෙස දක්වෙන්නේ එම වෝල්ටියතා තරංගයේ,
1. උපරිම අගය වේ. 2. අවම අගය වේ.
3. සාමාන්‍ය අගය වේ. 4. වර්ග මධ්‍යන මූල අගය වේ.

(20) 13A කෙවෙණි පිටුවානක් සහිත පරිපථයක් සඳහා භාවිත කළ යුතු වඩාත් සුදුසු සිගිති පරිපථ බිඳිනය (MCB) කුමක් ද?
1. 6A MCB 2. 10A MCB 3. 16A MCB 4. 20A MCB

(21) පරිණාමකයක ද්විතික දගරයේ ප්‍රතිධාන වෝල්ටියතාව සමානුපාතික වනුයේ,
1. පරිණාමකයේ දගරයේ දිග ප්‍රමාණයටයි. 2. දගරයේ ඔතා ඇති හරයේ හරස්කඩ වර්ගඵලයකි.
3. දගරයේ කම්බිවල විශ්කම්භයටයි. 4. දගරයේ පොටවල් ගණනටයි.

(22) පිළියවනයක් (Relay) තුළ එය ක්‍රියාත්මක වීමට, මූලික වශයෙන් ඇත්තේ,
1. විද්‍යුත් චුම්බකයකි. 2. ප්‍රතිරෝධකයකි. 3. සුවිචයකි. 4. ධාරිත්‍රකයකි.

(23) රථ වාහනවල භාවිත කරන ඊයම් අම්ල කෝෂයක් ආරෝපණය කිරීමට වඩාත් සුදුසු ක්‍රමය කුමක් ද?
1. ආරෝහනය කරන ලද තවත් කෝෂයක් භාවිත කිරීම.
2. සරල ධාරාවක් තවත් සරල ධාරාවකට පරිවර්තනය කරන උපකරණයක් භාවිතා කිරීම.
3. ප්‍රත්‍යාවර්ත ධාරාවක් සරල ධාරාවක් බවට පරිවර්ථනය කරන උපකරණයක් භාවිත කිරීම.
4. ප්‍රත්‍යාවර්ථ ධාරාවක් තවත් ප්‍රථ්‍යාවර්ථ ධාරාවක් බවට පරිවර්තනය කරන උපකරණයක් භාවිත කිරීම.

(24) පරිණාමකයක සිදුවන හානි ප්‍රධාන කොටස් දෙකකට වෙන් වේ. ඒවා මොනවාද?
1. තඹ හා තාප හානිය 2. යකඩ හා සුළි ධාරා හානිය
3. යකඩ හා මන්දායන හානිය 4. යකඩ හා තඹ හානිය

(25) සිලිකන් ඩයෝඩයක පෙර නැඹුරු වෝල්ටියතාව කොපමණ ද?
1. 0.2 V 2. 0.4 V 3. 0.6 V 4. 0.8 V

(26) වෝල්ටියතා ස්ථායිකරණ පරිපථයකට යොදා ගත හැකි ඩයෝඩය කුමක් ද?
1. ඍජුකාරක ඩයෝඩය 2. ලක්ෂ ස්පර්ශක ඩයෝඩය
3. සෙනර් ඩයෝඩය 4. ආලෝක විමෝචන ඩයෝඩය

(27) ස්ථිර චුම්බක භාවිත නොකරන්නේ පහත සඳහන් කුමන උපාංගයේ ද?
1. ස්පීකරය 2. සරල ධාරා කුඩා මෝටරය
3. පරිණාමකය 4. පාපැදි ඩයිනමෝව

(28) පහත දක්වා ඇති පරිදි IN 4007 ඍජුකාරක ඩයෝජයක් ප්‍රතිසම මල්ටි මීටරයක ඕම් පරාසයේ XI පරිමාණය භාවිත කර පරීක්ෂා කරන ලදි. එම පරීක්ෂාවේ දී පාඨාංකය $0\,\Omega$ ලෙස සඳහන් විය. මෙම ඩයෝඩය පිළිබඳ ඔබේ මතය කුමක් ද?




1. ඩයෝඩය ලුහු පරිපථ (short circuit) වී ඇත. 2. ඩයෝඩය විවෘත පරිපථ (open circuit) වී ඇත.
3. ඩයෝඩය දෝෂ රහිතය. 4. නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකිය.

(29) ආරෝපණය කළ හැකි කෝෂයක 1000mAh ලෙස සඳහන් කර ඇති අගය මගින් පැහැදිලි වන්නේ,

1. කෝෂයේ ආයු කාලය පැයක් බවය.
2. කෝෂයෙන් 1000 mA ධාරාවක් ලබා ගත හැකි බවය.
3. කෝෂය තුළ 1000 mA ධාරාවක් අඩංගු වී ඇති බවය.
4. කෝෂයෙන් 10 mA ධාරාවක් පැය 100 ක් තුළ ලබාගත හැකි බවය.

(30) සන්නායක හතක් ඇති යොතක 7/.50 ලෙස සඳහන් කර ඇත්තේ,

1. විශ්කම්භය අගල් 0.50 බවය.
2. විශ්කම්භය මිලිමීටර් 0.50 බවය.
3. වර්ගඵලය වර්ග අගල් 0.50 බවය.
4. වර්ගඵලය වර්ග සෙන්ටි මීටර් 0.50 බවය.

(31) පහත සංකේතයෙන් දැක්වෙන්නේ,



1. විචල්‍ය ධාරිත්‍රකයකි.
2. පෙර සැකසුම් ධාරිත්‍රකයකි.
3. ස්ථිර ධාරිත්‍රකයකි.
4. ආලෝක සංවේදී ධාරිත්‍රකයකි.

(32) $37_{10}$ ද්වීමය සංඛ්‍යා බවට පරිවර්තනය කළ විට ලැබෙන අගය කුමක් ද?

1. $101001_2$
2. $100011_2$
3. $100101_2$
4. $110010_2$

(33) සත්‍යතා වගුවට අදාළ ගේට් වර්ගය කුමක් ද?

| A | B | Q |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |

1. AND Gate
2. OR Gate
3. NAND Gate
4. NOR Gate

(34) (A + B)C යන තර්ක සම්බන්ධතාව ලබාගත හැකි ද්වාර පරිපථය කුමක් ද?

1.



2.



3.



4.



(35) කාරක වර්ධකයක සුවිශේෂී ගුණාංගයක් නොවන්නේ,

1. නොසලකා හැරිය හැකි ප්‍රමාණයේ කුඩා ධාරාවක් ලබා ගනී.
2. වැඩි ධාරාවක් ප්‍රතිදානයෙන් ලබා ගත හැකිය.
3. වෝල්ටියත සංසන්දකයක් ලෙස භාවිත කළ හැකිය.
4. අපවර්තක අග්‍රයට සංඥාවක් ලැබුණු විට එම වර්ගයේ සංඥාවක්ම ප්‍රතිදානයෙන් ලබා ගැනීමට හැකිය.

(36) NE 555 $I_C$ පරිපථය අග්‍ර නිවැරදිව පිහිටන්නේ,

1.



2.



3.



4.


(37) බහුකාර්ය අඩුවක මිටෙහි යොදා ඇති පරිවරණයෙහි 1000 V ලෙස සටහන් කර ඇත. එයින් අදහස් වන්නේ,
1. එය පරිහරණය කළ හැක්කේ 1000V ට වඩා වැඩි වෝල්ටියතාවක් සඳහා පමණක් බවය.
2. 1000 V ට වඩා වැඩි වූ විට එය මිටෙහි තාපය ජනනය වන බවය.
3. 1000 V ට වඩා අඩු විට එය මිටෙහි තාපය ජනනය වන බවය.
4. අඬුව පරිහරණය කළ හැක්කේ 1000 V ට වඩා අඩු වෝල්ටියතාවයක් සඳහා පමණක් බවත්ය.

(38) ට්‍රාන්සිස්ටරයක් සුවිචයක් ලෙස භාවිත කිරීමේ දී එය කපා හැරීමේ අවස්ථාවක් (Off) සංතෘප්ත අවස්ථාවක් (On) අතර දෝලනය වේ. මෙහි දී ඇති වාසියක් නොවන්නේ,
1. වෝල්ටිකතාවක් මගින් ක්‍රියාත්මක කළ හැකි වීම.
2. විද්‍යුත් පුළිඟු ඇති නොවීම.
3. ශබ්ද හා රේඩියෝ සංඥා පිට වීම.
4. ගෙවී යන කොටස් නොමැති වීම.

(39) ට්‍රාන්සිස්ටරයක් නැඹුරු කිරීමට,
1. ධන වෝල්ටියතාවයක් බේස් අග්‍රය වෙත සැපයිය යුතුය.
2. සෘණ වෝල්ටියතාවයක් බේස් අග්‍රය වෙත සැපයිය යුතුය.
3. බේස් එමීටර් සංධිය පසු නැඹුරු කළ යුතුය.
4. බේස් කලෙක්ටර් සංධිය පෙර නැඹුරු කළ යුතුය.

(40) පහත සඳහන් ආයතන අතරින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ලබාගත නොහැකි ආයතනය කුමක් ද?
1. ශ්‍රී ලංකා තාක්ෂණ විශ්ව විද්‍යාලය
2. ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය
3. පේරාදෙණිය විශ්ව විද්‍යාලය
4. වෘත්තිය තාක්ෂණික විශ්ව විද්‍යාලය

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved



අවසාන වාර පරීක්ෂණය - 2025
மூன்றாம் தவணைப் பரீட்சை - 2025
THIRD TERM TEST - 2025

90 S I,II

11 ශ්‍රේණිය | නිර්මාණකරණය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය - I, II

## නිර්මාණකරණය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය - II

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, අනෙකුත් ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමිවේ.

(01) (i) වස්තුවක සමාංශක ප්‍රක්ෂේපණ පෙනුමක් පහත දැක්වේ.




ඉහත සමාංශක රූපයට අනුව,
1. A ඊතලය දෙසින් බලා ඉදිරි පෙනුම ද,
2. B ඊතලය දෙසින් බලා පැති පෙනුම ද,
3. C ඊතලය දෙසින් බලා සැලැස්ම ද,

ඍජු ප්‍රක්ෂේපණ චිත්‍ර ඇඳීමේ දී තෙවන කෝණ ක්‍රමයට දී ඇති මිනුම්වලට අනුව සම්පූර්ණ පරිමාණයට අඳින්න. (සියළු ම මිනුම් මිලි මීටරවලිනි.)

(ii) * ඉදිරියෙන් දක්වා ඇති සැලැස්ම හා ඉදිරි පෙනුම සැලකිල්ලට ගෙන එහි විකසනය ඇඳ දක්වන්න. (සියලුම මිනුම් මිලි මීටර වලිනි)

* සැලකිය යුතුයි - මෙහි පතුල හා පියන රහිතය.



(02) i. විදුලි පහන් දෙකක් හා 13A කෙවෙණි පිටුවානක් සහිත ගෘහ විදුලි පරිපථයක තත් ඇදීමේ පරිපථ සටහනක් සම්මත සංකේත යොදා ගනිමින් අඳින්න. අදාළ සිගිති පරිපථ බිඳින ද ඒවායේ සම්මත අගයන් (Rated valurs) සහිතව පරිපථයට සම්බන්ධ කරන්න. (ල. 04)

ii. ගෘහස්ථ විදුලි පරිපථයකට සිගිති පරිපථ බිඳිනයක් සම්බන්ධ කිරීමේ හේතුව කුමක් ද? (ල. 02)

iii. කෙවෙනි පිටුවානකට භූගත සන්නායකයක් සම්බන්ධ කිරීමට හේතුව කුමක් ද? (ල. 02)

iv. සැපයුම ලබා දී ඇති ගෘහ විදුලි පරිපථයකට දිගුවක් ලබා දීමේ දී හෝ අලුත් වැඩියාවක දී ඔබ විසින් අනුගමනය කරන ආරක්ෂක පූර්වෝපාය දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(03)




රූපයේ දැක්වෙන්නේ 230V (AC) ලබා දී 12V (C) ද්විතිකයෙන් ලබා ගත හැකි අවකර පරිනාමකයකි.

i. අවකර පරිණාමක දැකිය හැකි අවස්ථා දෙකක් ලියන්න. (ල. 02)

ii. ද්විතිකයෙන් ලැබෙන සැපයුම AC (ප්‍රත්‍යාවර්ථ) වීමට හේතුව පැහැදිලි කරන්න. එහි සංඛ්‍යාතය කොපමණවේද? (ල. 02)

iii. ඩයෝඩ 4 ක් සහ 1000 « F ධාරිත්‍රකයක් ඔබට සපයා ඇත්නම් මෙය යොදා ගෙන සරල ධාරා සැපයුමක් සාදන ආකාරය ඇඳ දක්වන්න. (ල. 04)

iv. මෙම පරිපථයෙන් ස්ථාවර 6V Dc ධාරාවක් ලබා ගැනීමට යෙදිය යුතු උපාංග නම් කර එහි අග්‍ර පිහිටන ආකාරය ඇඳ දක්වන්න. (ල. 02)

(04) i. ප්ලෙමින්ගේ වමත් නියමය පැහැදිලි කරන්න. (ල. 02)

ii. සරල ධාරා මෝටර් වර්ග දෙක නම් කරන්න. (ල. 02)

iii. ස්ථිර චුම්බක සරල ධාරා මෝටරයක භ්‍රමණ දිශාව මාරු කල හැක්කේ කෙසේ ද? (ල. 03)

iv. ස්ථිර චුම්බක සරල ධාරා මෝටරයක භ්‍රමණ දිශාව මාරු කිරීම සඳහා ද්වි ධ්‍රැව දෙමං ස්විචයක් (DPDT) යොදා ගන්නා ආකාරය පරිපථයකින් ඇඳ දක්වන්න. (ල. 03)

(05)




i. ඉහත පරිපථයේ A, B, C, D, E උපාංග නම් කරන්න. (ල. 03)

ii. E උපාංගයේ කාණ්ඩ පැහැදිලි කරන්න. (ල. 02)

iii. E උපාංගය B වෙතත් B උපාංගය E වෙතත් ස්ථාන ගත කළ හොත් කුමක් සිදුවේද? (ල. 02)

iv. D උපාංගය සක්‍රිය තත්ත්වයට පත් කිරීම සඳහා විභවයන් සැපයුම යෙදිය යුතු ආකාරය ඇඳ දක්වන්න. (ල. 03)

(06)




i. ප්‍රතිදානය අනුව මෙම පරිපථය කුමන නමකින් හැඳින්වේද? (ල. 02)

ii. පරිපථයේ ප්‍රතිධාන තරංගය අඳින්න. (ල. 03)

iii. ප්‍රතිධාන තරංගයේ සංඛ්‍යාතය වෙනස් කිරීම සඳහා කුමන උපාංගවල අගය වෙනස් කළ යුතු ද? (ල. 03)

iv. මෙම පරිපථයේ ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල. 02)

(07) සංයෝජන තර්ක ද්වාර පරිපථයක් රූපයේ දැක්වේ.




i. ඉහත පරිපථයේ ඇති තර්ක ද්වාර නම් කරන්න. (ල. 03)

ii. z සඳහා බූලියානු ප්‍රකාශය ලියන්න. (ල. 02)

iii. z ප්‍රතිපාදනය සඳහා සත්‍යතා සටහන අඳින්න. (ල. 03)

iv. ඉහත පරිපථයේ ප්‍රතිධානය ලබා ගැනීමට යොදා ගත හැකි තනි ද්වාරයක් ලියන්න. (ල. 02)